# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2188/28 – 2020 අගෝස්තු 12 වැනි බදාදා – 2020.08.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 646, වාඩියගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වාඩියගොඩ (අගපි 1099) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KU/MWT/ 2018/018 හා 2018.05.04 දිනැති පූගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටස් සඳහා මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – මඩමේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0563**

උතුරට: හිමිකම් කියන්නා සහ ඉඩමේ නම සොයාගත නොහැකි ගෙවත්ත, ඒ. යූ. වේරගම හිමිකම් කියන සොහොනේකැල්ල සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී; දකුණට: මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය; බටහිරට: හිමිකම් කියන්නා සහ ඉඩමේ නම සොයාගත නොහැකි ගෙවත්ත.

02. **කැබලි අක්ෂර 'B' – මඩමේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0069**

උතුරට: ඒ. යූ. වේරගම හිමිකම් කියන සොහොනේකැල්ල සහ ඒ. කේ. ඒකනායක හිමිකම් කියන ගුරුවත්තේකුඹුර; නැගෙනහිරට: ඒ. කේ. ඒකනායක හිමිකම් කියන ගුරුවත්තේකුඹුර; දකුණට: මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය; බටහිරට: කැබලි අක්ෂර ඒ සහ ඒ. යූ. වේරගම හිමිකම් කියන සොහොනේකැල්ල.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය : 4-3/2/2015/PT/86.
2020 ජනවාරි මස 04 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 575